# උපකරණ නිෂ්කාශන පද්ධතිය (ECS)

## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ
## තනි පරිශීලකයින් සඳහා පරිශීලක උපදෙස් අත්පොත

# පටුන

හැඳින්වීම ........ 1

තනි පරිශීලක ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය ........ 1

වෙබ් ද්වාරයට ප්‍රවේශවීම ........ 6

තනි පරිශීලක ලියාපදිංචි කිරීමේ ආකෘති පත්‍රය ........ 6

තනි පරිශීලක උපකරණ පුවරුව පිළිබඳ දළ විශ්ලේෂණය ........ 7

උපකරණ ලියාපදිංචි කිරීමේ ක්‍රියාපටිපාටිය ........ 8

ප්‍රති අපනයනය සඳහා අයදුම් කිරීමේ ක්‍රියාපටිපාටිය ........ 16

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) මාර්ගගත ද්වාරය (online portal) තුළ පරිශීලකයින්ගේ ගිණුම් ලියාපදිංචි කිරීම, කළමනාකරණය කිරීම සහ අයදුම්පත්වල තත්ත්වය නිරීක්ෂණය කිරීම ඇතුළු අත්‍යවශ්‍ය ක්‍රියාවලීන් සිදු කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශය ලබා දීම පිණිස මෙම අත්පොත සකස් කර ඇත.

තනි පුද්ගල පරිශීලකයින් තම මෙහෙයුම් කටයුතු සිදු කරන සෑම අවස්ථාවකදීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ රෙගුලාසිවලට පූර්ණ අනුකූලතාව පවත්වා ගැනීම සහතික කළ යුතුය. ඒ සඳහා ආරක්ෂාව සහ ජාලයේ අඛණ්ඩ පැවැත්ම සම්බන්ධ ජාතික රෙගුලාසි වලට සියලුම විදුලි සංදේශ උපාංග අනුකූල වන බව තහවුරු කිරීම මෙන්ම, ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා අංකය ලියාපදිංචි කළ උපාංග සහ කෙටි පරාස උපාංග පමණක් මිලදී ගෙන භාවිත කිරීම වැනි අත්‍යවශ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය.

අදාළ අවශ්‍යතා සාර්ථකව සපුරාලමින්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සමඟ කාර්යක්ෂමව හා විධිමත්ව ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාම සඳහා තනි පරිශීලක ද්වාරය භාවිත කළ යුතු ආකාරය පිළිබඳව පියවරෙන් පියවර දැක්වෙන මාර්ගෝපදේශයක් මෙම පරිශීලක අත්පොත මගින් සපයනු ලැබේ.

## 2. තනි පරිශීලක ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය

- ඔබ භාවිත කිරීමට කැමති වෙබ් බ්‍රවුසරය විවෘත කරන්න. (වඩාත් ප්‍රශස්ත පරිශීලක අත්දැකීමක් සඳහා Google Chrome වෙබ් බ්‍රවුසරය භාවිත කිරීම නිර්දේශ කරනු ලැබේ.)
- ලබා දී ඇති වෙබ් සබැඳිය මත ක්ලික් කරන්න: https://ecs.trc.gov.lk/signup/individual
- පහත දැක්වෙන ආකාරයට ආරම්භක පිටුව දිස්වනු ඇත.



- නව පරිශීලකයින් පද්ධතියට පිවිසීමට පෙර ගිණුමක් නිර්මාණය කර ලියාපදිංචි විය යුතුය.
- ඊට පෙර, තනි පරිශීලක ගිණුමක් නිර්මාණය කිරීම සඳහා “තනි පරිශීලකයෙකු ලෙස පිවිසීම” මත ක්ලික් කරන්න.




- නව පරිශීලකයෙකු ලෙස “ගිණුමක් නිර්මාණය කරන්න” බොත්තම මත ක්ලික් කරන්න.



## නව ගිණුමක් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය

### පියවර 1: තනි පුද්ගල පරිශීලක ලියාපදිංචි කිරීමේ පෝරමය පිරවීම

- විද්‍යුත් තැපැල: ඔබගේ වලංගු විද්‍යුත් තැපැල් ලිපිනය ලබා දෙන්න.
- මුරපදය: ආරක්ෂිත මුරපදයක් ඇතුළත් කරන්න.
- මුරපදය නැවත ඇතුළත් කිරීම: මුරපදය නැවත ටයිප් කිරීමෙන් ඔබගේ මුරපදය තහවුරු කරන්න.
- ඉන්පසු, පරිශීලක වර්ගය ලෙස “තනි පුද්ගල පරිශීලක” තෝරන්න.
- නිල් පැහැති “විද්‍යුත් තැපැල තහවුරු කරන්න” බොත්තම ක්ලික් කරන්න. එවිට තහවුරු කිරීමේ කේතයක් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යවනු ලැබේ.



**පියවර 2: විද්‍යුත් තැපැල තහවුරු කිරීම**

- විද්‍යුත් තැපැල තහවුරු කරන්න" බොත්තම ක්ලික් කළ පසු, "ඔබ විසින් ලබා දී ඇති විද්‍යුත් තැපැල් ලිපිනය වෙත තහවුරු කිරීමේ කේතය සාර්ථකව යවා ඇත. කරුණාකර ඔබගේ විද්‍යුත් තැපැල පරීක්ෂා කරන්න." යන කොළ පැහැති සාර්ථක බවට පණිවිඩය තිරය මත දිස්වනු ඇත.
- ඔබගේ විද්‍යුත් තැපැල පරීක්ෂා කරන්න: ඔබගේ විද්‍යුත් තැපැල් ගිණුමේ Inbox වෙත පිවිස, TRCSL වෙතින් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනය වෙත ලැබී ඇති විද්‍යුත් තැපැල් පණිවිඩය සොයා පරීක්ෂා කරන්න.




**පියවර 3: තහවුරු කිරීමේ කේතය**

- කේතය ඇතුළත් කිරීම: නැවත වෙබ් ද්වාරය වෙත පිවිස, "තහවුරු කිරීමේ කේතය" යන ක්ෂේත්‍රයට ඉලක්කම් 6කින් සමන්විත කේතය ඇතුළත් කරන්න.
- ගිණුම සාදන්න: නිල් පැහැති "ගිණුම සාදන්න" බොත්තම ක්ලික් කරන්න.


Individual User Registration
Note: Not for Vendor License holders.
Verification code sent successfully to sampleindividual1@outlook.com.
Please check your mail
Email-:
sampleindividual1@outlook.com
Please proceed
Password:
Re-Enter Password-:
Confirm Email
Confirmation Code-:
469042
Create Account
Cancel


Individual User Registration
Note: Not for Vendor License holders.
Email-:
Email
Password:
Password
Re-Enter Password-:
Re-Enter Password
Confirm Email
Confirmation Code-:
Confirmation code
Create Account
Cancel
Account created successfully. Please log in.
3
Redirecting to login...
Go to Login Now

## 3. වෙබ් ද්වාරයට පිවිසීම

- විද්‍යුත් තැපැල: ඔබ ලියාපදිංචි කර ඇති විද්‍යුත් තැපැල් ලිපිනය ඇතුළත් කරන්න.
- මුරපදය: ඔබගේ මුරපදය ඇතුළත් කරන්න.
- ඉදිරිපත් කිරීම: නිල් පැහැති “පිවිසීම” බොත්තම ක්ලික් කරන්න




## 4. තනි පුද්ගල පරිශීලක ලියාපදිංචි කිරීමේ ආකෘති පත්‍රය

**පියවර 1: අයදුම්පත වෙත යොමු වීම**

පරිශීලක ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා, තනි පුද්ගල පරිශීලක ලියාපදිංචි කිරීමේ පෝරමය පුරවන්න.

- පැති තීරුවේ ඇති “තනි පුද්ගල පරිශීලක බලපත්‍ර අයදුම්පත” මත ක්ලික් කරන්න.
- පෝරමයක් සහිත පිටුවක් විවෘත වේ( නව පරිශීලකයින් සඳහා මුලින් හිස්ව පවතී)

**පියවර 2: අවශ්‍ය තොරතුරු ඇතුළත් කිරීම**



# 5. තනි පුද්ගල පරිශීලක උපකරණ පුවරුව පිළිබඳ දළ විශ්ලේෂණය

සාර්ථකව වෙබ් ද්වාරයට පිවිසීමෙන් පසු, පහත සඳහන් කොටස්වලින් සමන්විත ප්‍රධාන උපකරණ පුවරුව ඔබට දැකගත හැකිය.

- ඉහළ තීරුව: TRCSL ලාංඡනය සහ පරිශීලක පැතිකඩ සඳහා වන පහළට විවෘත වන මෙනුව
- පැති තීරු මෙනුව:
  - උපකරණ පුවරුව
  - තනි පුද්ගල පරිශීලක බලපත්‍ර අයදුම්පත
  - මාදිලි අනුමැතිය
  - උපාංග ලියාපදිංචිය
  - ප්‍රති අපනයනය
  - පරිශීලක පැතිකඩ



# 6. උපාංග ලියාපදිංචි කිරීම

## 6.1. ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා අංකය සහිතව රඳවා ඇති උපාංග

පියවර **1:** උපාංග ලියාපදිංචි කිරීමේ අංශය වෙත ප්‍රවේශ වීම

- වම් පස පිහිටි පැති මෙනුවෙන් **"උපාංග ලියාපදිංචිය"** යන කොටස වෙත ප්‍රවේශ වන්න.
  - ඉන් අනතුරුව, උපාංග ලියාපදිංචිය **->> ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා අංකය සහිතව රඳවා ඇති උපාංග** ඔස්සේ අදාළ කොටස වෙත ප්‍රවේශ වන්න.




- ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා අංකය සහිතව රඳවා ඇති උපාංග මත ක්ලික් කිරීමෙන් පසු, පහත දැක්වෙන තිරය වෙත ඔබව යොමු කරනු ලැබේ.
- ඉහත දැක්වෙන පිටුවේ ඇති "නව එකතු කිරීම - Add New button " බොත්තම මත ක්ලික් කරන්න.
- පරිශීලක තොරතුරු සහ ඉන්වොයිස් තොරතුරු ඇතුළත් කරමින් අයදුම්පත්‍රය සම්පූර්ණ කරන්න.
- නව එකතු කිරීම - Add New මත ක්ලික් කළ පසු, පහත දැක්වෙන තිරය වෙත ඔබව යොමු කරනු ලැබේ.



පියවර 2: පෞද්ගලික පරිහරණය සඳහා ගුවන්විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ රේගු නිෂ්කාශනය ලබා ගැනීම සඳහා අයදුම් කිරීම




- **“අයදුම්පත් විස්තර”** යන කොටස යටතේ, අවශ්‍ය විස්තර ඇතුළත් කළ යුතුය.



- පහළට ගෙන යාමෙන්, **“ගුවන්විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ පිළිබඳ විස්තර”** යන කොටස යටතේ උපකරණ විස්තර ඇතුළත් කළ යුතුය. පෙන්වා ඇති “උපකරණ එකතු කරන්න- Add Equipment ” බොත්තම මත ක්ලික් කරන්න. එවිට පහත දැක්වෙන කවුළුව වෙත ඔබව යොමු කරනු ලැබේ.
- ඉන්පසු, නිවැරදි විස්තර ඇතුළත් කළ යුතු අතර, ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා අංක කිහිපයක් ඇතුළත් කිරීමට අවශ්‍ය නම්, “+” ලකුණ මත ක්ලික් කරන්න.




- අවශ්‍ය විස්තර සම්පූර්ණයෙන් ඇතුළත් කළ පසු, එම විස්තර එකතු කිරීම සඳහා පහත පෙන්වා ඇති “එකතු කරන්න - “Add” ” බොත්තම මත ක්ලික් කළ යුතුය.



- විස්තර එකතු කළ පසු, එම විස්තර පහත දැක්වෙන ආකාරයට දිස්වේ.




- ඉන්පසුව, **"අනෙකුත් විස්තර"** කොටස සහ **"ප්‍රකාශය"** කොටස යටතේ අදාළ විස්තර ඇතුළත් කරන්න.

- අනතුරුව, "ප්‍රකාශය" කොටස යටතේ "ඉහත ප්‍රකාශය මම මෙයින් පිළිගනිමි." යන පාඨයට යාබදව ඇති කොටුවේ සලකුණක් යොදන්න. එවිට දිනය ඇතුළත් කිරීමේ කොටුව තුළ වර්තමාන දිනය ස්වයංක්‍රීයව දිස්වනු ඇත.



- ඉන්පසුව, **“සහායක ලේඛන”** කොටස යටතේ අදාළ සහායක ලේඛන එකතු කරන්න.







- ඉහත සඳහන් කළ පරිදි, සහායක ලේඛන කිහිපයක් එකතු කිරීමට අවශ්‍ය අවස්ථාවක, ඒවා එකින් එක වෙන වෙනම තෝරා ගැනීම වෙනුවට, අවශ්‍ය සියලුම ලේඛන එකවර තෝරා ගන්න.



- ගොනුව එකතු කළ පසු, **“ඉදිරිපත් කරන්න”** බොත්තම මත ක්ලික් කිරීමෙන් අයදුම්පත ඉදිරිපත් කළ යුතුය. ඉන්පසුව, ඉදිරිපත් කිරීම තහවුරු කිරීම සඳහා කවුළුවක් දිස්වන අතර, ඉදිරිපත් කිරීම තහවුරු කිරීමට **“ඔව්”** යන බොත්තම මත ක්ලික් කරන්න




- අයදුම්පත සාර්ථකව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, පහත දැක්වෙන තහවුරු කිරීමේ පිටුව තිරය මත දිස්වනු ඇත.
- “ඔබගේ තත්ත්වය පරීක්ෂා කරන්න” මත ක්ලික් කළ විට හෝ නැවත “රඳවා තබා ඇති ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා අංක සහිත උපාංග” යන කොටස වෙත පිවිසි විට, ඉදිරිපත් කරන ලද ඉල්ලීම් පහත දැක්වෙන ආකාරයට දිස් වනු ඇත.



- ඉල්ලීම සාර්ථකව ඉදිරිපත් කළ විට, “අනුමැති තත්ත්වය” යටතේ “සමාලෝචනය සඳහා යොමු කර ඇත” යන තත්ත්වය ප්‍රදර්ශනය වේ. ඉල්ලීම සාර්ථකව ඉදිරිපත් කර නොමැති විට, “ක්‍රියාමාර්ග” තීරුව යටතේ “ඉදිරියට පවත්වාගෙන යන්න” සහ “මකා දමන්න” යන කරුණු දෙක දිස් වේ.




- ඉල්ලීම ඉදිරිපත් කළ පසු, ඔබ විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) වෙත ලැබී ඇති බව දැනුම් දෙමින් තහවුරු කිරීමේ විද්‍යුත් තැපැල් පණිවිඩයක් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනය වෙත ලැබෙනු ඇත.



**ECS-CCL-I-20260909-001 Custom Clearance Request**

Dear Applicant,

We have received your Custom Clearance request.
Reference Number: ECS-CCL-I-20260909-001.

The request is in progress, and we will update you once the process advances and 2026-09-23 and the completion date is 2026-09-23 and tracking of the request available via https://www.ecs.trc.gov.lk.

This response is automatically generated by the Equipment Clearance System of TRCSL. Please do not reply.

Best regards,
**Equipment Clearance System Team.**

## 6.2. අනුක්‍රමික අංක සහිතව රඳවා තබා ඇති උපාංග

- 4.1 වගන්තිය යටතේ “රඳවා තබා ඇති  ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා අංකය සහිත උපාංග” සඳහා විස්තර කර ඇති ආකාරයටම, අදාළ පියවරයන් අනුගමනය කරන්න.

## 6.3. ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා අංක සහිතව රඳවා නොමැති උපාංග

- කරුණාකර 4.1 වගන්තිය යටතේ ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා අංක සහිතව රඳවා ඇති උපාංග සඳහා විස්තර කර ඇති පියවරයන් අනුගමනය කරන්න.

# 7. ප්‍රති අපනයන අයදුම් කිරීමේ ක්‍රියාවලිය

### පියවර 1: ප්‍රති අපනයන කොටස වෙත පිවිසීම

- වම් පස පිහිටි මෙනුවෙන් **“ප්‍රති- අපනයනය”** යන කොටස තෝරා එයට පිවිසෙන්න.
- “ප්‍රති අපනයනය” යන කොටස මත ක්ලික් කළ විට, පහත දැක්වෙන දේ ඔබගේ තිරය මත දිස්වනු ඇත.
- ඉහත පෙන්වා ඇති පිටුවෙහි, පහත දැක්වෙන පරිදි “නව එකතු කිරීම - Add New” බොත්තම මත ක්ලික් කරන්න.




- පළමු කොටස තුළ පෞද්ගලික තොරතුරු දැකිය හැකිය.
- තිරය පහළට ගෙන යමින්, අයදුම්පත්‍රයේ අවශ්‍ය තොරතුරු ඇතුළත් කර එය සම්පූර්ණ කරන්න.



**පියවර 2: අයදුම්පත්‍රය පිරවීම**

- පහත සඳහන් ආකාරයට,
- **ගුවන්විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ පිළිබඳ විස්තර"** යන කොටසෙහි, අදාළ උපාංගය සඳහා " ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා අංකය සහිත" හෝ "ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා අංකය රහිත" යන තත්ත්වයන්ගෙන් නිවැරදි තත්ත්වය තෝරාගන්න.
- නියැදි ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා අංක CSV ගොනුව හෝ නියැදි අනුක්‍රමික අංක CSV ගොනුව බාගත කර, එම ගොනුවෙහි නිවැරදි කළ තොරතුරු ඇතුළත් කිරීමෙන් අනතුරුව ගොනුව සුරකින්න. දත්ත ඇතුළත් කළ Excel ගොනුව සුරකින විට, එය CSV UTF-8 ආකෘතිය ලෙස සුරකින බවට වග බලා ගන්න.




- "ගොනුව තෝරන්න -Choose File" බොත්තම තෝරා, ඔබගේ පරිගණකයේ ගබඩා කර ඇති ගුවන්විදුලි හා විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) අනුක්‍රමික අංක හෝ ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා අංක (IMEI) ලැයිස්තුව අඩංගු CSV ගොනුව තෝරාගන්න.



- ඉන් අනතුරුව, පහත දැක්වෙන තිරයේ ඇති “**Declaration**” **(ප්‍රකාශය)** කොටස යටතේ, “I hereby accept the above declaration” (ඉහත ප්‍රකාශය මම මෙයින් පිළිගනිමි) යනුවෙන් සඳහන් කොටසට ඉදිරියෙන් ඇති කොටුව (tick box) සලකුණු කරන්න. එම කොටුව සලකුණු කළ පසු, “දිනය” (date) සඳහන් කළ යුතු ස්ථානයෙහි වත්මන් දිනය ස්වයංක්‍රීයව දිස්වනු ඇත.
- “**Supporting Documentations**” **(සහායක ලේඛන)** කොටස යටතේ, ඔබගේ පරිගණකයේ ගබඩා කර ඇති අදාළ ලේඛන උඩුගත කිරීම සඳහා, අදාළ කොටස්වල ඇති “Choose File” (ගොනුව තෝරන්න) යන්න ක්ලික් කර, අවශ්‍ය සහායක ලේඛන එක් කරන්න.




- ඉන් අනතුරුව, ගොනුව **(file)** එක් කිරීමෙන් පසු, **“Submit”** බොත්තම ක්ලික් කර ඉල්ලීම ඉදිරිපත් කළ යුතුය. එවිට ඉල්ලීම තහවුරු කිරීම සඳහා තහවුරු කිරීමේ කවුළුවක් දිස්වන අතර, ඉල්ලීම තහවුරු කිරීමට “**Yes**” යන්න ක්ලික් කළ යුතුය.



- ඉල්ලීම් පත්‍රය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, ඔබ වෙත තහවුරු කිරීමේ පිටුවක් (confirmation page) දිස්වනු ඇත. එම පිටුවෙහි ඇති නිල් පැහැති “Check Your Status” (තත්ත්වය පරීක්ෂා කරන්න) බොත්තම ක්ලික් කිරීමෙන්, පහත දැක්වෙන තිරවල පරිදි ඔබ ඉදිරිපත් කළ ඉල්ලීමේ තත්ත්වය පරීක්ෂා කළ හැකිය. එමෙන්ම, “Re-Export” (ප්‍රති අපනයනය) වෙත පිවිසීම මඟින් ද අදාළ ඉල්ලීම් නැරඹීමට හැකිය.
- ඉල්ලීම ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, ඔබේ ඉල්ලීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) වෙත සාර්ථකව ලැබී ඇති බව තහවුරු කරමින් විද්‍යුත් තැපැල් පණිවිඩයක් ඔබ වෙත ලැබෙනු ඇත.